Pope's Worldwide Prayer Network
SRI LANKA

MISERANDO ATQUE ELIGENDO

# ශුද්ධෝත්තම පියතුමාගේ ලෝක ව්‍යාප්ත යැදුම් ජාලයේ යැදුම් අදහස් - 2023

**ජනවාරි**

අධ්‍යාපන කාර්යයෙහි නියැලෙන්නන් සඳහා

තම ජිවත තුළින් විශ්වාසනීය සාක්ෂිදරනන් වෙමින්ද, යොවුන් පරපුර සහ ජීවිත අවදානම් තත්වයෙහි සිටින්නන්ට උපකාර වෙමින් තරගකාරිත්වය වෙනුවට සහෝදර සබැඳියාව උගන්වන්නන් වීමට අධ්‍යාපන කාර්යයෙහි නියැලෙන්නන් වෙනුවෙන් යාච්ඤා කරමු.

**පෙබරවාරි**

මීසම් සඳහා

සහභාගිත්වය කේන්ද්‍ර කොට ගෙන, විශ්වාසය මත පදනම් වු සංඝයන් ලෙස වර්ධනය වෙමින් ජීවිත අවශ්‍යතා වලින් පෙළෙන්නන්ව පිළිගැනීම සහ සහෝදර සබැඳියාව දක්වමින් ක්‍රියා කීරිමට මීසම් සංඝයන්ට හැකි වන පිණිස යාච්ඤා කරමු.

**මාර්තු**

අපචාරයන්ට ගොදුරු වුවන් සඳහා

ශුද්ධවු සභා සමාජිකයන් නිසා පිඩාවට පත්වු අය ශුද්ධ වූ සභා මාතාව තුළම තම වේදනා වල සහ දුක් වීදිමට පිළිතුරු සොයා කටයුතු කිරිමට හැකි වන පිණිස ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරමු.

**අප්‍රේල්**

සාමයේ සහ අහිංසාවේ සංස්කෘතියක් සඳහා

රාජ්‍යයන් සහ රට වැසියන් අවි ආයුධ භාවිතය අවම කිරීම තුළින් සාමයේ සහ හිංසාවෙන් තොර සංස්කෘතියක් පැතිරවීමට ක්‍රියා කරනු පිණිස යාච්ඤා කරමු.

**මැයි**

ශුද්ධ වූ සභා සංවිධානයන් සහ කණ්ඩායම් සඳහා

සුපුවත දේශනා කිරීමේ දූත මෙහෙවර දෛනිකව යළි පණ ගැන්වීම කර ගැනීම තුළින්ද ලොවේ අවශ්‍යයතාවන්ට සරිලන ලෙස ඔවුන්ගේ කරිස්මාවන් තුළින් ස්ථාපිත කර ගැනීම සඳහා සභා සංවිධානයන්ට සහ කණ්ඩායම් වලට හැකි වනු පිණිස අපි යාච්ඤා කරමු.

**ජූනි**

වධ හිංසා පැමිණවීම අවලංගු කිරීම සඳහා

ජාත්‍යන්තර ප්‍රජාව වධ හිංසා පැමිණ වීම අවලංගු කිරීම සඳහා තිරසාර ක්‍රියා මාර්ග ගන්නා ලෙසද, වධ හිංසා වලට ගොදුරු වුවනට සහ එම පවුල් වලට උදව් කිරීම තහවුරු කරන මෙන් ඉල්ලා අපි යාච්ඤා කරමු.

**ජූලි**

දිව්‍ය සත්ප්‍රසාදීය පිවිතය සඳහා

කතෝලික බැතිමතුන් දිව්‍ය සත්ප්‍රසාදය සැමරීම තම පිවිතයේ කේන්ද්‍රස්ථානය කර ගන්නා මෙන්ද, එමගින් මිනිස් සබඳතා ගැඹුරු කරගෙන, දෙවිඳුන් සහ තම සහෝදර සහෝදරියන් හමුවීම සඳහා විවෘත වීමට හැකි වන ලෙස ඉල්ලා අපි යාච්ඤා කරමු.

**අගෝස්තු**

ජාත්‍යන්තර යොවුන් දිනය සඳහා

යොවුන් පරපුර තම ජීවිතය තුළින් සුභ ආරංචියට සාක්ෂි දරමින් ජීවත් වීමට, ලිස්බන් නුවර පැවැත්වෙන ජාත්‍යන්තර යොවුන් දිනය උපකාරයක් වන පිණිස ඉල්ලා අපි යාච්ඤා කරමු.

**සැප්තැම්බර්**

සමාජ සීමාන්ත වල (මායිම්) තුළ ජීවත්වන්නන් සඳහා

සමාජ උපාන්තයන්හි අමානුෂික ජීවිත තත්වයන් තුළ සිටිනා අයවලුන් නොසලකා නොහැර ඔවුනට අඩු සැලකිලි නොදක්වා ක්‍රියා කිරීමට අදාළ සංවිධානයන්ට හැකි වන පිණිස අපි යාච්ඤා කරමු.

**ඔක්තෝබර්**

සභා සම්මේලනය සඳහා

ශුද්ධ වු සභාව ශුද්ධාත්මයාණන් විසින් මග පෙන්වනු ලැබ සෑම කාලයන්හිදීම සවන්දීමේ සහ සංවාදයේ ජීවිත රටාවක් ගොඩ නගා ගනිමින් ලෝකයේ සෑම මායිමක් කරා ගමන් කරනු පිණිස අපි යාච්ඤා කරමු.

**නොවැම්බර්**

ශුද්ධෝත්තම පියතුමා සඳහා

ශුද්ධෝත්තම පියතුමා ශුද්ධාත්ම පිහිට ලැබ තම දූත මෙහෙවර ඉටු කරමින් තමන්ට බාරවු රැළ සමග ගමන් කිරීමට හැකි වන පිණිස අපි යාච්ඤා කරමු.

**දෙසැම්බර්**

ආබාධිත තත්වයන් සමග ජීවත් වන අය සඳහා

ආබාධිත තත්වයන් සමග ජීවත් වන පුද්ගලයින් සමාජ අවධානයේ කේන්ද්‍රස්ථානය වී අදාළ සංවිධානයන් ඔවුන්ගේ ක්‍රියාකාරි සහාගිත්වය අගය කිරීම සඳහා ඔවුන්ගේ සහභාගි වීම ඇතුළත් වු වැඩසටහන් දියත් කරනු පිණිස යාච්ඤා කරමු.

වතිකානය, 2022 පෙබරවාරි මස 09

ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ